*සැ. යු.*- 2024.03.15 දින පළ කරන ලද අංක 2376 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,377 - 2024 මාර්තු මස 22 වැනි සිකුරාදා - 2024.03.22**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 916 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 916 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 918 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට්* පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

915 B 082552 — 01 (2024/03)

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2024 අංක 342

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ලලින්ද වීරරත්න මාපලගම ගමගේ මහතා 2024 පෙබරවාරි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2024 මාර්තු මස 02 වැනි දින.

03-369

## රජයේ නිවේදන

ලියාපදිංචි කිරීමේ ආ 96
(ඊ 2)/2/64

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය :- 1546

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම් ප්‍රකාශය අනුව විජයසිංහ රාජපක්ෂ ආරච්චිගේ නලින් සමන්ත විජයසිංහ වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදුකිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| *විස්තරය* | *පිහිටීම* | | *දිස්ත්‍රික්කය* | *දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| | *ගම හෝ වීදිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | | | |
| ලූර්දු මාතා දේවස්ථානය | ග්ලෙනනෝර් වත්ත | හපුතලේ | බදුල්ල | ගරු. සමීර පෙරේරා පියතුමා | රෝමානු කතෝලික |

වර්ෂ 2024 ක් වූ මාර්තු මස 04 වැනි දින බත්තරමුල්ලේ දී මාගේ අත්සන තබන ලදී.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

03-363/1

ලියාපදිංචි කිරීමේ ආ 97
(එෆ් 2)/2/64

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථාන ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව විජයසිංහ රාජපක්ෂ ආරච්චිගේ නලින් සමන්ත විජයසිංහ නැමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මා විසින්, ප්‍රසිද්ධ දේවස්ථානයක් ලෙස ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදුකිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තර* | *පිහිටීම* | *දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1546 | 2024.02.26 | ලූර්දු මාතා දේවස්ථානය | ග්ලෙනනෝර් වත්ත | ගරු. සමීර පෙරේරා පියතුමා | රෝමානු කතෝලික |

වර්ෂ 2024 ක් වූ මාර්තු මස 04 වැනි දින.
බත්තරමුල්ල,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

03-363/2

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/09/2024/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස්කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි II තීරුවේ සඳහන් ඉඩම් සහ III තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ I තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2024.03.22** වැනි දින සිට **2024.04.05** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 10.00 සිට ප. ව. 3.00** දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2024.04.12** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II තීරුව* *ඉඩම්වල විස්තර* | *III තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දෙහි. කොට්ඨාසයේ, 23 වෙළුමේ, 129, 130 පත්‍රිරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාවේ පිහිටි "අඹගහවත්ත" නමැති ඉඩමේ කැබලි අංක 04 සඳහා මායිම්, | 01. එම්. එච්. ජී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1971.12.03 දින ලියා සහතික කරන ලද අංක 1150 දරන තෑගි ඔප්පුව.<br><br>02. සී. ඒ. එස්. ජයවීර බණ්ඩාර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.03.21 දින ලියා සහතික කරන ලද අංක 2074 දරන තෑගි ඔප්පුව. |

*උතුරට* : කැබලි අංක 03;

*නැගෙනහිරට* : කැබලි අංක 07 (ජයවර්ධන මාවත);

*දකුණට* : කැබලි අංක 05;

*බස්නාහිරට* : ජල මාර්ගය;

බිම් ප්‍රමාණය : පර්. 6.75

03-388

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සෙලාන් බැන්ක් පී. එල්. සී. - ගාල්ල ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව යොමු PQ 9 යටතේ ලියාපදිංචි කළ)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මතය.

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.03.15 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂිතවම සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගිණුම් අංකය : 0160-34509551-101.

දංගෙදර පදිංචි ගෝපික ප්‍රියරන්ජික මිරිස්ස ලොකුගේ යන අය "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. දසිතා ප්‍රියන්ති විසින් ලියා සහතික කළ 2023 නොවැම්බර් 01 දිනැති අංක 2652 දරන උකස් බැඳුම්කරය මත අයවීමට ඇති ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය මත සමාන කළ වාරික අත්තිකාරම් සම්බන්ධයෙන් මුළු මුදල සහ 2024 මාර්තු 01 දින දක්වා පොළිය වශයෙන් රුපියල් හය මිලියන දෙසිය අසූහයදහස් හාරසිය හැටනවයයි ශත හතළිස් තුනයි (රු. 6,286,469.43) මුදලක් ද, 2024 මාර්තු 02 දින සිට වාර්ෂිකව සියයට දහහත (17%) බැගින් රුපියල් පන් මිලියන නවසිය අසූනවදහස් දෙසිය හැත්තෑතුනයි ශත හැත්තෑතුනක (රු. 5,989,273.73) මුදලක් මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත දැන් අයවීමට හිඟව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ රුපියල් හය මිලියන දෙසිය අසූහයදහස් හාරසිය හැටනවයයි ශත හතළිස් තුනයි (රු. 6,286,469.43) එකී මුදල ද සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය දක්වා 2024 මාර්තු 02 දිනැති ඉහත කී පරිදි පොළිය ද, ප්‍රචාරණ පිරිවැය ද එකී පනතේ 13 වන වගන්තිය යටතේ ඕනෑම වෙනත්

ගාස්තු ද සමග ඉන් අනතුරුව යම් ගෙවීම් (වෙතොත්) ලැබී ඇත්නම් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අංක 2652 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කරන ලද ඉඩම සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන චන්දිමා ගමගේ මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල මහනගර සභා සහ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 970 - දංගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දංගෙදර පිහිටි හිරිඹුර පාර, වරිපනම් අංක 357/A/6 දරන දොරවල කණුවල අගබොඩ හි ලොට් C හි ලොට් C1 වශයෙන් වෙන් කළ ලොට් 17 සහ 18 කැබලිවල ඒකාබද්ධ කළ ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සකස් කළ 2015.03.11 දිනැති අංක 36A/2015 දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරු නැගෙනහිරට : පාර (අඩි 20 පළල) සහ හිරඹුර පාර, වරිපනම් අංක 357/A/8 ද, දකුණු නැගෙනහිරට : මහවත්ත ද, දකුණට : ලොට් 19 - හිරිඹුර පාර, වරිපනම් අංක 357 A/7 ද, බටහිරට : ලොට් 21 (අඩි 10 පළල පාර) ද, උතුරු බටහිරට : මෙම ඉඩමේම ලොට් 27 සහ 28 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම හතරක් (පර්. 12.4) හෝ හෙක්ටෙයාර 0.03139ක් ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස දැනට තිබෙන සහ සියලු නිශ්චල සහ චංචල කම්හල් සහ යන්ත්‍ර ද සහාධිපත්‍ය පිඹුර සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි - ඒකක ද ඇතුළුව ඒවාට සීමා නොවී මින් මතු ඉදි කරනු ලබන ඒ මත පිහිටි ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති

03-393/1

---

### සෙලාන් බැන්ක් පී. එල්. සී. - මොරටුව ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව යොමු PQ 9 යටතේ ලියාපදිංචි කළ)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මතයයි.

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.03.15 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂිතවම සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගිණුම් අංකය : 0090 12849791-001

ලියාපදිංචි කිරීම් අංක PV101611 දරන මොරටුව තම ලියාපදිංචි කිරීමේ කාර්යාලය සහිතව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඩී. එම්. එන්. එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ මොරටුව පදිංචි වත්තකුවත්ත වඩුගේ නීලක ඉෂාන් ප්‍රනාන්දු යන අය "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ9) නමින් ප්‍රසිද්ධ නොතාරිස් සඳමාලි භාරතිරත්න විසින් ලියා සහතික කළ 2017 දෙසැම්බර් 12 දිනැති අංක 2024 දරන උකස් බැඳුම්කරය මත අයවීමට ඇති ගෙවීම පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත කාලීන ණය මුදල - ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිමූල්‍ය පහසුකම සම්බන්ධයෙන් ප්‍රාග්ධන මුදල සහ 2024 පෙබරවාරි 28 දිනට පොළිය වශයෙන් රුපියල් විසිහත් මිලියන පන්සිය අනූතුන්දහස් තුන්සිය විසිනවයයි ශත හැටනවයක (රු. 27,593,329.69) එකතු වූ මුදලක් ද, 2024 පෙබරවාරි 29 දින සිට වාර්ෂිකව සියයට දහහතර (14%) බැගින් රුපියල් විසිපන් මිලියන පන්දහස් පන්සියක (රු. 25,005,500.00) මුදලක් මත වැඩිදුර පොළිය ද, සමග දැන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත අයවීමට හිඟව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ රුපියල් විසිහත් මිලියන පන්සිය අනූතුන්දහස් තුන්සිය විසිනවයයි ශත හැටනවයක (රු. 27,593,329.69) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2024 පෙබරවාරි 29 දින සිට ඉහත කී පරිදි පොළිය ද, ප්‍රචාරණ පිරිවැය ද එකී පනතේ 13 වන වගන්තිය යටතේ ඕනෑම වෙනත් ගාස්තු ද සමග ඉන් අනතුරුව යම් ගෙවීම් (වෙතොත්) ලැබී ඇත්තනම් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අංක 2024 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන චන්දිමා ගමගේ මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවෙහි, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනගර සභා සීමා තුළ කොරලවැල්ල ග්‍රාම

නිලධාරි කොට්ඨාසය තුළ කොරලවැල්ල ග්‍රාමයෙහි පිහිටි "මාදම්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සකස් කළ 2008.03.06 දිනැති අංක 5197A දරන මිනින්දෝරු සැලැස්මේ නිරූපිත ලොට් 19 (බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සකස් කළ 2008.02.26 දිනැති අංක 5187 දරන මිනින්දෝරු සැලැස්මේ නිරූපිත ලොට් 1හි අනුබෙදීමක් වන) වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : බී. ඩී. එස්. සිරිරත්න හිමිකම්පාන මෙම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙහිම ලොට් අංක 35 ද, දකුණට : මෙහිම ලොට් අංක 13 ද (අඩි 20 සිට 30 දක්වා පළල පාර) සහ බටහිරට : මෙහිම ලොට් අංක 13 සහ 18 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතරක් (පර්. 24) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

අංක 5197A දරන පිඹුරේ ලොට් 13 මතින් මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති

03-393/2

---

**සෙලාන් බැන්ක් පී. එල්. සී. - කොට්ටාව ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව යොමු PQ 9 යටතේ ලියාපදිංචි කළ)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මතයයි.

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.03.15 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂිතවම සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගිණුම් අංකය : 0330-06050720-001

බැඳුම්කරු/ උකස්කරු වශයෙන් හෝමාගම පදිංචි විරන්ත හරිස්චන්ද්‍ර හෙට්ටිආරච්චි යන අය විසින් සෙලාන් බැන්ක් පී. එල්. සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ9) නමින් ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ගුණවර්ධන ලියා සහතික කළ 2014 මාර්තු 18 දිනැති අංක 1290, 1291, 1292 දරන උකස් බැඳුම්කර මත සහ පිළිවෙළින් 2014 ඔක්තෝබර් 01 දිනැති දිනපොත් අංක 3/1026, 3/1027, 3/1028 ද, 2015 ජුනි 16 දිනැති 3/3120 ද, 2015 ජූනි 30 දිනැති 3/4209 ද සහ 2018 මැයි 11 දිනැති 3/3533 යන දිනපොත් අංක යටතේ 00030048113 දරන හිමිකම් සහතික පත්‍රයෙහි ලියාපදිංචි උකස් සාධන පත්‍ර සහ පිළිවෙළින් 2016 පෙබරවාරි 24 දිනැති අංක 3/1343 සහ 2017 ජුනි 12 දිනැති අංක 3/4013 දරන දිනපොත් අංක යටතේ අංක 0003155 දරන හිමිකම් සහතික පත්‍රයෙහි ලියාපදිංචි උකස් සාධන පත්‍ර ද මත අයවීමට ඇති ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර මත කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් මුළු මුදල සහ 2023 ඔක්තෝබර් 04 දින දක්වා පොළිය වශයෙන් රුපියල් එකසිය පනස්තුන් මිලියන අටසිය හැත්තෑ දෙදහස් හත්සිය තිස්අටයි ශත තිස්හතරක (රු. 153,872,738.34) මුදලක් ද, 2023 ඔක්තෝබර් 05 දින සිට සියයට විස්සයි දශම එකයි එක (20.11%) බැගින් රුපියල් එකසිය දහහත් මිලියන පන්සිය හැත්තෑ හය දහසක (රු. 117,576,000.00) මුදලක් මත පොළිය ද, සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත දැන් අයවීමට හිඟව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ රුපියල් එකසිය පනස්තුන් මිලියන අටසිය හැත්තෑ දෙදහස් හත්සිය තිස්අටයි ශත තිස්හතරක (රු. 153,872,738.34) එකී මුදල ද එය සම්පූර්ණයෙන් අයකර ගන්නා දිනය තෙක් 2023 ඔක්තෝබර් 05 දින සිට ඉහත කී පරිදි පොළිය ද, ප්‍රචාරණ පිරිවැය ද එකී පනතේ 13 වන වගන්තිය යටතේ ඕනෑම වෙනත් ගාස්තු ද සමග ඉන් අනතුරුව යම් ගෙවීම් (වෙතොත්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ගුණවර්ධන ලියා සහතික කළ 2014 මාර්තු 18 දිනැති අංක 1290, 1291, 1292 දරන උකස් බැඳුම්කර මගින් සහ පිළිවෙළින් 2014 ඔක්තෝබර් 01 දිනැති දිනපොත් අංක 3/1026, 3/1027, 3/1028 ද 2015 ජුනි 16 දිනැති 3/3120 ද, 2015 ජූලි 30 දිනැති 3/4209 ද සහ 2018 මැයි 11 දිනැති 3/3533 යන දිනපොත් අංක යටතේ 00030048113 දරන හිමිකම් සහතික පත්‍රයෙහි ලියාපදිංචි උකස් සාධන පත්‍ර සහ පිළිවෙළින් 2016 පෙබරවාරි 24 දිනැති අංක 3/1343 සහ 2017 ජුනි 12 දිනැති අංක 3/4013 දරන දිනපොත් අංක යටතේ අංක 0003155 දරන හිමිකම් සහතික පත්‍ර මගින් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලැබීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමා තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ගලවිලවත්ත උතුර අංක 486සී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හෝමාගම ග්‍රාමයෙහි පිහිටි මැනුම්පති විසින් සකස් කළ කලාප අංක 21 අංක 520001 කැඩැස්තර සිතියමෙහි නිරූපිත සහ

හෙක්ටෙයාර බින්දුවයි දශම දෙකයි අටයි පහයි නවයකින් (හෙ. 0.2859) සමන්විත බෙදා වෙන් කළ ලොට් අංක 0350 දරන සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේය.

ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ගුණවර්ධන විසින් ලියා සහතික කළ 2014 මාර්තු 18 දිනැති අංක 1290, 1291, 1292 දරන උකස් බැඳුම්කර සහ පිළිවෙළින් 2014 ඔක්තෝබර් 01 දිනැති අංක 3/1026, 3/1027, 3/1028 ද, 2015 ජුනි 16 දිනැති 3/3120 ද, 2015 ජූලි 30 දිනැති 3/4209 ද සහ 2018 මැයි 11 දිනැති 3/3533 යන දිනපොත් අංක යටතේ අංක 00030048113 දරන හිමිකම් සහතිකයේ ලියාපදිංචි කළ උකස් සාධන පත්‍ර යටතේ උකස් කළ දේපළ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමා තුළ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලවිලවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හෝමාගම ග්‍රාමයෙහි පිහිටි මැනුම්පති විසින් සකස් කළ ලොට් අංක 21 අංක 520001 කැඩැස්තර සිතියමෙහි ලොට් අංක 0142 වශයෙන් නිරූපිත සහ හෙක්ටෙයාර බින්දුවයි දශම එකයි හතයි හයයි හයක් (හෙ. 0.1766) ප්‍රමාණයකින් සමන්විත බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද සමග, හිමිකම් සහතික අංක 0003155 පිළිවෙළින් 2016 පෙබරවාරි 24 දිනැති අංක 3/1343 සහ 2017 ජුනි 12 දිනැති 3/4013 දරන දිනපොත් අංක 0003155 දරන හිමිකම් සහතිකයේ ලියාපදිංචි උකස් සාධන පත්‍රය යටතේ උකස් කළ දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති

03-393/3

---

**සෙලාන් බැන්ක් පී. එල්. සී. - ගම්පහ ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව යොමු PQ 9 යටතේ ලියාපදිංචි කළ)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මතයයි.

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.03.15 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂිතවම සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගිණුම් අංකය : 0110-12777090-001

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත්තා වූද, තම ලියාපදිංචි අංක PV 13301 සහිතව සහ ගම්පහ ලියාපදිංචි කාර්යාලය සහිතව සමාගමක් වන ගම්පහ ඩිවලොප්මන්ට් කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගම "ගැනුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ9) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් ලියා සහතික කළ 2017 ජූලි 11 දිනැති අංක 1312 සහ 1313 දරන උකස් බැඳුම්කර මත අයවීමට ඇති ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර පහත සඳහන් පරිදි පහසුකම් මත (පමා සහන පහසුකම් බැහැරව) එකී උකස් බැඳුම්කර මත 2023 මාර්තු 27 දක්වා ප්‍රාග්ධන මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙසිය තිස්හතර මිලියන නවසිය අසූනව දහස් අටසිය දහඅටයි ශත අසූතුනක (රු. 234,989,818.83) එකතු වූ මුදලක් සහ පොළිය සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත දැන් අයවීමට හිඟව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් දෙසිය තිස්හතර මිලියන නවසිය අසූනව දහස් අටසිය දහඅටයි ශත අසූතුනක (රු. 234,989,818.83) එකී මුදල ද, 2023 මාර්තු 23 දින සිට සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය දක්වා පහත සඳහන් පරිදි පොළිය ද, ප්‍රචාරණ ගාස්තු ද, එකී පනතේ 13 වගන්තිය යටතේ ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉහත කී බැඳුම්කර යටතේ අයවීමට ඇති ප්‍රමාණයෙන් කොටසක් ගෙවා පියවීම වශයෙන් ඉන් අනතුරුව ලැබී ඇති ගෙවීම් (වෙතොත්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති එකී බැඳුම්කර මගින් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීමට බලයලත් වෙන්දේසිකරු චන්දිමා ගමගේට බලය ලබාදෙන බව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) රු. 41,975,000.00 ක ප්‍රතිව්‍යුහගත කළ කාලීන ණය මුදල 1 පහසුකම සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දිනට රුපියල් පනස්අට මිලියන හාරසිය දහසය දහස් පන්සිය අනූහතයි ශත දහහතරක (රු. 58,416,597.14) මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2023 මාර්තු 28 දින සිට වාර්ෂිකව සියයට දහහතයි දශම හතයි පහ (17.75%) බැගින් රුපියල් හතළිස් එක් මිලියන නවසිය හැත්තෑපන් දහසක (රු. 41,975,000.00) මුදලක් මත වැඩිදුර පොළිය ද සමග,

(ආ) රු. 55,200,000.00 ක ප්‍රතිව්‍යුහගත කළ කාලීන ණය මුදල 2 පහසුකම සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දිනට රුපියල් හැත්තෑ හය මිලියන අටසිය විසිඑක්දහස් අටසිය විසිහයයි ශත තිස්පහයි (රු. 76,821,826.35) මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2023 මාර්තු 28 දින සිට වාර්ෂිකව සියයට දහහතයි දශම හතයි පහ (17.75%) බැගින් රුපියල් පනස් පන්මිලියන දෙසිය දහසක (රු. 55,200,000.00) මුදලක් මත වැඩිදුර පොළිය ද සමග,

(ඇ) රු. 29,707,000.00 ක ප්‍රතිව්‍යුහගත කළ කාලීන ණය මුදල 3 පහසුකම සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දිනට රුපියල් හතළිස් එක් මිලියන තුන්සිය හතළිස් තුන්දහස් දෙසිය විසිහතරයි ශත පනස් තුනක (රු. 41,343,224.53) මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2023 මාර්තු 28 දින සිට වාර්ෂිකව සියයට දහහතයි දශම හතයි පහ (17.75%) බැගින් රුපියල් විසිනව මිලියන හත්සිය හත්දහසක (රු. 29,707,000.00) මුදලක් මත වැඩිදුර පොළිය ද සමග,

(ඈ) රු. 36,915,000.00ක ප්‍රතිව්‍යුහගත කළ කාලීන ණය මුදල 4 පහසුකම සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දිනට රුපියල් පනස්එක් මිලියන තුන්සිය හැත්තෑහතර දහස් පන්සිය අනූහයයි ශත හතළිස් තුනක (රු. 51,374,596.43) මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2023 මාර්තු 28 දින සිට වාර්ෂිකව සියයට දහහතයි දශම හතයි පහ (17.75%) බැගින් රුපියල් තිස්හය මිලියන නවසිය පහළොස් දහසක (රු. 36,915,000.00) මුදලක් මත වැඩිදුර පොළිය ද සමග,

(ඉ) රු. 5,122,601.33 ක ප්‍රතිව්‍යුහගත කළ කාලීන ණය මුදල 4(අ) පහසුකම සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දිනට රුපියල් හත්මිලියන තිස්තුන් දහස් පන්සිය හැත්තෑ හතරයි ශත තිස් අටක (රු. 7,033,574.38) මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2023 මාර්තු 28 දින සිට වාර්ෂිකව සියයට දහහත (17%) බැගින් රුපියල් පන් මිලියන එකසිය විසිදෙදහස් හයසිය එකයි ශත තිස්තුනක (රු. 5,122,601.33) මුදලක් මත වැඩිදුර පොළිය ද සමග,

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීම් කොට්ඨාසය, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා තුළ නිට්ටඹුව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නඹදලුව ග්‍රාමයෙහි පිහිටි "අඹගහවත්ත කොටස" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. මාන්නප්පෙරුම විසින් සකස් කළ 2011 ඔක්තෝබර් 16 දිනැති අංක 1398 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර සහ ඒ. පී. සෙනේහාමිගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : එලන් පීරිස්ගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, දකුණට : ඒ. ඇල්බට් සහ තවත් අයට අයිති ඉඩම ද සහ බටහිරට : ලාල් පෙරේරා සහ තවත් අයට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිස්හතක (රූ.2, පර්. 37) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් ලියා සහතික කළ 2017 ජූලි 11 දිනැති අංක 1313 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් කළ දේපළ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීම් කොට්ඨාසයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා තුළ තල්ගස්මොටේ නැගෙනහිර 328/බී ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තල්ගස්මොටේ ග්‍රාමයෙහි පිහිටි "හික්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ විසින් සකස් කළ 2013 පෙබරවාරි 18 දිනැති අංක 4307/A දරන පිඹුරෙන් නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : රෝහණ නෙත්තසිංහ හිමිකම්පාන මෙම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : චන්ද්‍රා ඒකනායක සහ අජිත නෙත්තසිංහ හිමිකම්පාන ඉඩම ද (අංක 426 පිඹුරේ ලොට් 2), දකුණට : පාර (මා.ස.අ.) (වේයන්ගොඩ සිට නිට්ටඹුව දක්වා) සහ බටහිරට : ජයලතා වීරසේකර සහ ලීලා ගුණරත්න හිමිකම්පාන ඉඩම් ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විස්සක (රූ.2, පර්. 20) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් ලියා සහතික කළ 2017 ජූලි 11 දිනැති අංක 1312 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් කළ දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතීඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති

03-393/4

---

### සෙලාන් බැංකුව - බොරැල්ල ශාඛාව

### නිවැරදි කිරීමේ දැන්වීම

වර්ෂ 2023.11.10 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළවූ සෙලාන් බැංකුව, බොරැල්ල ශාඛාවේ ගිණුම් අංක 0820-33525006-001 දරන ගිණුම හිමි වෙදගේ ඇන්ඩ් කම්පැනි සහ වෙදගේ

දොන් වසන්ත කුමාර යන අයගේ දේපළ වෙන්දේසි කිරීමේ තීරණයට අනුව අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ දිනය වර්ෂ 2023.09.26 වෙනුවට වර්ෂ 2023.10.24 දින ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති

03-393/5

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2023 නොවැම්බර් මස 14 දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදි. එනම්,

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය (බැංකුව) වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් බී. කේ. සූරියාරච්චි විසින් සහතික කරන ලද 2017.02.08 දින අංක 1557 දරන උකස් බැඳුම්කරය සහ එකී ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් ම සහතික කරන ලද 2017.02.08 දින අංක 1559 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. කේ. අනුෂා එම්. කුමාරි විසින් සහතික කරන ලද 2017.08.29 දින අංක 392 දරන උකස් බැඳුම්කරය සහ එකී ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් ම සහතික කරන ලද 2018.10.30 දින අංක 546 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කර පවරා දී ඇති සහ මෙහි උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් මත අයවිය යුතු මුදල් ගෙවීම ගාල්ල වක්වැල්ල පාරේ පදිංචි (ණය ගැනුම්කරු වන) කලහේ ආචාරිගේ කාල්ස් වෙස්මන් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු වන ණය ගැනුම්කරු විසින් ඉහත කී උකස් බැඳුම්කර යටතේ ඔහුගේ සින්නක්කර අයිතිය හිමිකම සහ සම්බන්ධතාව බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2023 ඔක්තෝබර් මස 02 වැනි දිනය වන විට බැංකුව වෙත ඉහත කී අංක 1557, 1559, 392 සහ 546 දරන උකස් බැඳුම්කර මත රුපියල් මිලියන අසූදෙකයි අටලක්ෂ අසූනව දහස් අටසිය අනූනවයයි ශත හතළිස් හතක් වූ (රු. 82,889,899.47) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර ඇත්නම්, එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තුවක් ද සමග ඉහත කී රුපියල් මිලියන අසූදෙකයි අටලක්ෂ අසූනවදහස් අටසිය අනූනවයයි ශත හතළිස් හතක් වූ (රු.82,889,899.47) මුදලක් හෝ දේපළ වෙන්දේසි සිදු කිරීමේ අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2023 ඔක්තෝබර් මස 03 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් :

(i) ඉහත කී අංක 392 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට, වර්ෂයකට සියයට දහඅටයි දශම හතයි පහක් වූ (18.75%) අනුපාතිකය යටතේ එකී උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන හතයි හාරලක්ෂ අනූනව දහස් නවසිය අසූඅටක් වූ (රු. 7,499,988.00) මුදල මත අයවිය යුතු ;

(ii) ඉහත කී අංක 1557 දරන උකස් බැඳුම්කරය සහ අංක 1559 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට, වර්ෂයකට සියයට දහඅටයි දශම හතයි පහක් වූ (18.75%) අනුපාතිකය යටතේ එකී උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන නවයයි අටලක්ෂ විසිතුන්දහස් හත්සිය තිස්හතරක් වූ (රු. 9,823,734.00) මුදල මත අයවිය යුතු; සහ

(iii) ඉහත කී අංක 1557 දරන උකස් බැඳුම්කරය සහ අංක 546 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට, වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහක් වූ (18.25%) අනුපාතිකය යටතේ එකී උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන තිහක් වූ (රු. 30,000,000.00) මුදල මත අයවිය යුතු,

පොළිය අයකර ගැනීම සඳහා එකී ණය මුදල්/ පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස් කරන ලද පහත විස්තර කරන ලද දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතා ඇතුළුව එම දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපති මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ නොතාරිස් විකිණිය යුතු යැයි සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බැංකු අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උපලේඛනය

#### I වන කොටස

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල

මහ නගර සභා සීමාව ඇතුළත, දන්ගෙදර නැගෙනහිර - 97D ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත දන්ගෙදර පිහිටි "දොරවල කානුවල අගබොඩ *හෙවත්* බෙරවායින්නේ වත්ත අද්දර කුඹුර සහ ඕවිට *හෙවත්* වෙදගේකුඹුර *හෙවත්* පරුස්සේ කුඹුර *හෙවත්* පරුස්සේ ඕවිට *හෙවත්* පොල්කොරටුව" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු යූ. වේවැල්වල විසින් සාදන ලද 2015.09.15 දින අංක 2460 දරන පිඹුරේ ලොට් අංක 15 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : එම ඉඩමේ ම ලොට් අංක 16; නැගෙනහිරට : එම ඉඩමේ ම ලොට් අංක 17 (අඩි 20ක් පළල පාර); දකුණට : එම ඉඩමේම ලොට් අංක 14 සහ දොරවල කානුවල අගබොඩ හි කොටක්; බටහිරටඃ දොරවල කානුවල අගබොඩ හි කොටසක් යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 2460 දරන පිඹුරට අනුව එකී මායිම් ඇතුළත ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතයි බින්දුවක් වූ (පර්. 8.70) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත කී ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා සීමාව ඇතුළත, දන්ගෙදර නැගෙනහිර - 97D ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත දන්ගෙදර පිහිටි "දොරවල කානුවල අගබොඩ *හෙවත්* බෙරවායින්නේ වත්ත අද්දර කුඹුර සහ ඕවිට *හෙවත්* වෙදගේකුඹුර *හෙවත්* පරුස්සේ කුඹුර *හෙවත්* පරුස්සේ ඕවිට *හෙවත්* පොල්කොරටුව" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කුසුමන් සිරිවර්ධන විසින් සාදන ලද 1995.01.20 දින අංක 18A/1995 දරන පිඹුරේ ලොට් අංක 15 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 16, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් අංක 17 (අඩි 20ක් පළල පාර), දකුණටඃ ලොට් අංක 14, බටහිරට : දොරවල කානුවල අගබොඩ හි කොටසක් යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 18A/1995 දරන පිඹුරට අනුව එකී මායිම් ඇතුළත ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතයි බිංදුවක් වූ (පර්. 8.70) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ Q 185/22 දරන වෙළුමේ/පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු කුසුමන් සිරිවර්ධන විසින් සදන ලද ඉහත කී 1995.01.20 දින අංක 18A/1995 දරන පිඹුරේ ලොට් අංක 17 ලෙස ලකුණු කර නිරූපණය කර ඇති මාර්ගය හරහා යාමේ අයිතිය ද වෙනත් අයිතිවාසිකම් ද සමග වේ.

II වන කොටස

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා සීමාව ඇතුළත, මඩපතල - 97B ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, කුඹල්වැල්ල ගමේ මීනුවන්ගොඩ පිහිටි "ලත්ත වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ආර්. උයන්ගොඩ විසින් සාදන ලද 2013.02.28 දින අංක 5213 දරන පිඹුරේ ලොට් C ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට :එම ඉඩමේ ම ලොට් B ; නැගෙනහිරට : ලොට් $C^1$ ; දකුණට : එම ඉඩමේ ම ලොට් D ; බටහිරට : දොල යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 5213 දරන පිඹුරට අනුව එකී මායිම් ඇතුළත ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම බින්දුවයි අටක් වූ (පර්. 9.08) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත කී ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ :-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා සීමාව ඇතුළත, මඩපතල - 97B ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, කුඹල්වැල්ල ගමේ මීනුවන්ගොඩ පිහිටි "ලත්ත වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඒ. ආර්. වීරසූරිය විසින් සාදන ලද 2001.01.09 දින අංක 1531 දරන පිඹුරේ ලොට් C ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : එම ඉඩමේම ලොට් B ; නැගෙනහිරට : ලොට් X ; දකුණට : එම ඉඩමේ ම ලොට් D ; බටහිරට : ඇල යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 1531 දරන පිඹුරට අනුව එකී මායිම් ඇතුළත ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම බින්දුවයි අටක් වූ (පර්. 9.08) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත කී ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ :-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා සීමාව ඇතුළත, මඩපතල - 97B ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, කුඹල්වැල්ල ගමේ මීනුවන්ගොඩ පිහිටි "ලත්ත වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ගාල්ල දිසා අධිකරණයේ අංක 17677 දරන නඩු වාර්තාවට ගොනු කරන ලද සහ බලයලත් මිනින්දෝරු එෆ්. ඒ. ගුණසේකර විසින් සාදන ලද අංක Lr. C දරන පිඹුරේ ලොට් C ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරටඃ එම ඉඩමේ ම ලොට් B; නැගෙනහිරට : ගනේගොඩවත්ත; දකුණටඃ එම ඉඩමේම ලොට් D ; බටහිරට : අඩි පාර සහ දොල යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී Lr. C දරන පිඹුරට අනුව එකී මායිම් ඇතුළත ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම බින්දුවයි අටක් වූ (පර්. 9.08) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A 380/85 දරන වෙළුමේ/පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇත.

තව ද, විදුලි සැපයුම් පද්ධතිය සහ උපකරණ, ජල සැපයුම් පද්ධතිය සහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ ඇතුළු ඉහත සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉඩම් කොටස් සඳහා දැනට හෝ මින්මතු කලින් කල සවිකරනු ලැබිය හැකි හෝ ස්ථිරව එකතු කරනු ලැබිය හැකි එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපාංග, සවිතුරු, සවිකිරීම් සහ වෙනත් සේවාවන් ද ඊට ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී.

03-380

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2023 දෙසැම්බර් මස 15 දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදි. එනම්,

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී (බැංකුව) ආයතනය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යසාරා ගයනි කස්තුරිආරච්චි විසින් සහතික කරන ලද 2020.01.30 දින අංක 383 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර පවරා දෙන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තරකර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/ මූල්‍ය පහසුකම් මත අයවිය යුතු මුදල් ගෙවීම සිංහාරමුල්ල, කැලණිය පදිංචි ("පළමු ණය ගැණුම්කරු වන") ජනක ප්‍රසාන්න හේවගේ යන අය විසින් සහ සිංහාරමුල්ල, කැළණිය පදිංචි ("දෙවන ණය ගැණුම්කරු වන") මනෝජ් ජීවනී සෙනරත් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

පහත සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයේ බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරු වන " පළමු ණය ගැණුම්කරු" විසින් ස්වකීය බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය ඉහත කී අංක 383 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2023 දෙසැම්බර් මස 07 වැනි දිනය වන විට ඉහත කී අංක 383 දරන උකස් බැඳුම්කරය මත බැංකුව වෙත රුපියල් මිලියන නවයයි දහතුන්දහස් අටසිය පනස් දෙකයි ශත තිස්හතරක් වූ මුදලක් (රු. 9,013,852.34) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන නවයයි දහතුන්දහස් අටසිය පනස් දෙකයි ශත තිස්හතරක් වූ මුදලක් (රු. 9,013,852.34) හෝ දේපළ වෙන්දේසි දිනය වනවිට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2023 දෙසැම්බර් මස 08 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට පහළොවයි දශම හතයි පහක් වූ (15.75%) අනුපාතිකයක් යටතේ ඉහත කී අංක 383 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන හයයි හයලක්ෂ හැත්තෑතුන්දහස් හත්සිය හතළිස් හතයි ශත හතක් වූ (රු. 6,673,747.07) මුදලක් මත පොළිය ද අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කරය මත ප්‍රදානය කරන ලද ඉහත කී ණය මුදල්/ මූල්‍ය පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස් කරන ලද පහත විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර එන්. යූ. ජයසූරිය මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර තුළ මාතර මහනගර සභා සීමාව ඇතුළත මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 409B, වල්ගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත, වල්ගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල විසින් සාදන ලද 2016 ජනවාරි මස 21 දින අංක 3797 දරන මිනින්දෝරු පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 2G1, 2G, 2H සහ 2I ද, නැගෙනහිරට: මෙම ඉඩමේ ලොට් අංක 5 සහ ලොට් අංක 11 ද (මාර්ගය), දකුණට : ලොට් අංක 11 (මාර්ගය) සහ මෙම ඉඩමේ ලොට් අංක 2L1 සහ 2L2 ද,බටහිරට: මෙම ඉඩමේ ලොට් අංක 2L1 සහ 2L2 මෙන්ම මෙම ඉඩමේ ලොට් අංක 2G1, 2G, 2H සහ 2I ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 3797 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දාසයයි දශම හතයි බිංදුවක් වූ ද (පර්. 16.70) මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A 840/42 දරන වෙළුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී "ලොට් 1" දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ ඒ මතවූ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී අංක 3797 දරන පිඹුරේ බටහිර මායිමේ පෙන්වා ඇති මාර්ගය ඔස්සේ යෑම ඒමේ මාර්ග පරවශතා අයිතිය සහ වෙනත් පහත සඳහන් සමාන අයිතිවාසිකම් ද සමග වේ. (මෙම ඉඩමේ ලොට් 2G1) එනම් :-

තව ද, උපකරණ සමග විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංගය සහ වායු සමීකරණ උපාංගය ඇතුළු ඉහත සවිස්තරාත්මව විස්තරකර ඇති ඉඩම් කොටස් සඳහා දැනට සවිකර ඇති හෝ ස්ථිරව සවිකර ඇති හෝ මෙහි මින්මතු කලින්කලට සවිකරනු ලැබිය හැකි හෝ ස්ථිරව එකතු කරනු ලැබිය හැකි සියලු සහ වෙන් වෙන් වශයෙන් වූ නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපාංග, සවිකුරු, සවිකිරීම් සහ වෙනත් සේවාවන් ද ඊට ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

03-391

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 අප්‍රේල් මස 18 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී, පහත සඳහන් යෝජනාව විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

"ප්‍රසිද්ධ නොතාරිස් සී. කේ. වික්‍රමනායක විසින් සහතික කරන ලද අංක 481 සහ 2006.10.28 දින දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් බී. එච්. එන්. අයි. සෙනවිරත්න විසින් සහතික කරන ලද අංක 158 සහ 2011.09.22 දින දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් ශානිකා දිසානායක විසින් සහතික කරන ලද අංක 77 සහ 2016.06.27 දින දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් සනුෂි එස්. හේමන්තා විසින් සහතික කරන ලද අංක 301 සහ 2019.10.30 දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද, මෙහි පහත උපලේඛනයේ I වන සහ II වන කොටස්වල සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය, එලෙස ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/ණය පහසුකම් ගෙවා පියවා දැමීම, 2007 අංක 07 දරන සමාගම් පනතේ යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන, කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පාර, අංක 257 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV 17969 දරන, ඊ අයි ඇන්ඩ් එම් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිකරු වන ඉහත කී ණයගැණුම්කරු විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 481, 158, 77 සහ 301 දරන උකස් බැඳුම්කර යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද;

ඒ අනුව, ඉහත කී අංක 481, 158, 77 සහ 301 දරන උකස් බැඳුම්කර මත 2023 මාර්තු මස 28 වැනි දිනට රුපියල් හතළිස් හතර කෝටි අසූපන්ලක්ෂ හැත්තෑදහස් හාරසිය හතළිස් හයකුත් ශත තිස්හයක (රු. 448,570,446.36) මුදලක් එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද;

එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (එකී ප්‍රධාන පනත) යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින්, රුපියල් හතළිස් හතර කෝටි අසූපන්ලක්ෂ හැත්තෑදහස් හාරසිය හතළිස් හයකුත් ශත තිස්හයක (රු. 448,570,446.36) මුදලක් හෝ එකී දේපළ විකිණීමේ දිනය වන විට එයින් නොගෙවා ඉතිරිව තිබෙන යම් මුදලක් සහ ඊට අමතරව, පහත සඳහන් මුල් මුදල් වටිනාකම් මත එනම්,

(i) ඉහත කී අංක 481, 158, 77 සහ 301 දරන උකස් බැඳුම්කරවලින් උකසට තබන ලද සහ එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් දහනවකෝටි තිස්හතර ලක්ෂ පනස්දහසක (රු. 193,450,000.00) මුදල මත වර්ෂයකට සියයට දහහතරයි දශම දෙකයි පහ (14.25%) බැගින් ද,

(ii) ඉහත කී අංක 481, 158, 77 සහ 301 දරන උකස් බැඳුම්කරවලින් උකසට තබන ලද සහ එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් එකොළොස්කෝටි පනස්හත්ලක්ෂ තුන්දහස් හාරසිය අනූතුනකුත් (රු. 115,703,493.99) මුදල මත වර්ෂයකට සියයට විසි පහ (25%) බැගින් ද,

(iii) ඉහත කී අංක 481, 158, 77 සහ 301 දරන උකස් බැඳුම්කරවලින් උකසට තබන ලද සහ එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් හත්කෝටි හතළිස් ලක්ෂ තිස්දෙදහස් අටසිය හැටකුත් ශත අසූතුනක (රු. 74,032,860.83) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම එකයි අට (8.18%) බැගින් ද,

වන පරිදි 2023 මාර්තු මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් පොළිය සහ තව ද, ප්‍රචාරණ වියදම් සහ දේපළ විකිණීමේ පිරිවැය සහ ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද වෙනත් ගාස්තු යනාදිය සහ තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා, එකී ණය මුදල්/ ණය පහසුකම් සඳහා ඉහත කී බැඳුම්කර මගින් ඇපයක් වශයෙන් එකී බැංකුවට උකසට තබන ලද මෙහි පහත සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බුක්තිය ඇතුළුව එකී දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ."

### උපලේඛනය
### (ඉඩමේ සහ පරිශ්‍රයේ විස්තරය)

#### *I වන කොටස*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, දළුගම නාගරික සභා සීමාවේ, හුණුපිටියේ පිහිටි බිසොප් පාරේ, වර්තමානයේ වරිපනම් අංක 24 දරන "ආනන්ද" වශයෙන් හඳුන්වන සහ දන්නා කහටගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. කාර්තිගේසු විසින් මැන සාදන ලද අංක 132 සහ 1942 ජනවාරි මස 21 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම ලොට් 1 දරන ඉඩම් කැබැල්ල ද, නැගෙනහිරට : දුම්රිය පරිශ්‍රය ද, දකුණට : කොමර්ෂල් කම්පැනි ලිමිටඩ් සමාගමට අයිති ඉඩම ද, බස්නාහිරට : වත්තල සිට ඇවරිවත්ත දක්වා වැටී ඇති, බිසොප් පාර වශයෙන් හඳුන්වන (හුණුපිටිය සිට වත්තල දක්වා වැටී ඇති පාර වශයෙන් ද හඳුන්වන), පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි, ඉහත කී අංක 132 දරන පිඹුර අනුව, රූඩ් තුනකුත් පර්චස් තිස්අටක් (රූ.3, පර්. 38) විශාල වූ ද, බලයලත් මිනින්දෝරු ආර්. එම්. අර්ථනායක විසින් මැන සාදන ලද අංක 285 සහ 1952 පෙබරවාරි මස 02 දින දරන පිඹුර අනුව රූඩ් තුනකුත් පර්චස් තිස්පහක් (රූ. 3, පර්. 35) විශාල වූ ද, තව ද, බලයලත් මිනින්දෝරු ජී. ඒ. එච්. පිලිපියා විසින් මැන සාදන ලද අංක 4688 සහ 1986 ජනවාරි මස 13 දින දරන මෑතකාලීන පිඹුර අනුව රූඩ් තුනකුත් පර්චස් තිහයි දශම පහක් (රූ.3, පර්. 30.5) විශාල වූ ද, ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සියලුම ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C/503/322 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ලේ වර්තමානයේ තිබෙන හෝ මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇඳුණු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ ඇතුළු විදුලි සැපයුම් පද්ධති, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමග ය.

#### *II වන කොටස*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, කටාන පළාත් පාලන ආයතන බලසීමාවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, අංක 114 දරන අම්බලම්මුල්ල ග්‍රාම නිලධාරි වසමේ, කිඳිගොඩ පිහිටි "සූරියගහ කුඹුර දන්ඩිගේ *නොහොත්* දඹුවාගේ කුඹුර ගොඩැල්ල" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 6111 සහ 1943.10.02 දින දරන පිඹුරේ නිරූපිත ඉඩම සහ පරිශ්‍රයට මායිම්, උතුරට : රන්මුකගේ ජූස් පීරිස් යන අයගේ උරුමක්කාරයන්ට අයිති කුඹුර සහ එම්. බී. ප්‍රනාන්දු සහ තවත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : ඊරිප්පුගේ එලාරිස්ට යන අයට අයිති ඉඩම, වර්ලියනු යන අයට අයිති කුඹුර, එම්. බී. ප්‍රනාන්දු යන අයට අයිති ඉඩම සහ කුරුගමගේ ඇන්තනී පෙරේරා යන අයට අයිති ඉඩම ද, දකුණට : කුරුගමගේ ඇන්තනී පෙරේරා යන අයට අයිති ඉඩම සහ දඩුගම ඔය ද, බස්නාහිරට : පී. ජෝන් ප්‍රනාන්දු යන අයට අයිති කුඹුර ද, යන මෙකී මායිම් තුළ පිහිටි, ඉහත කී අංක 6111 දරන පිඹුර අනුව, අක්කර දෙකකුත් රූඩ් දෙකයි පර්චස් විසිහයක් (අ.2, රූ.2, පර්. 26) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C/705/44 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ලේ වර්තමානයේ තිබෙන හෝ මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇඳුණු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ ඇතුළු විදුලි සැපයුම් පද්ධති, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

03-403

---

### පබ්ලික් බැංකුව බර්හාඩ්

2003 නොවැම්බර් 27 සහ 2019 සැප්තැම්බර් 30 වැනි දින මැලේසියාවේ, පබ්ලික් බැංකුව, බර්හාඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කර ගත් සම්මුතියක සහතික කරන ලද උපුටා ගැනීම

1988 අංක 30 දරන පනතේ බැංකු ව්‍යාපාරයේ අර්ථය ඇතුළත බලයලත් වාණිජ බැංකුවක් වන සහ 1990 අංක 4 දරන බැංකු පනතේ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ

(විශේෂ විධි විධාන) පනතේ අර්ථය ඇතුළත බැංකුවක් වන සහ එහි ලියාපදිංචි කාර්යාලය, 27 වන මහල, මෙනාරා පබ්ලික් බැංකුව, 146, ජලන් ඇම්පැන්ග්, 50450, කුවලා ලම්පූර්, මැලේසියාව හි ඇති සහ ශාඛා කාර්යාලයක් සහ ව්‍යාපාර ස්ථානයක් අංක 340, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03 හි ඇති, පබ්ලික් බැංකුව බර්හාඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් පහත පරිදි නිශ්චය කරනු ලබයි.

දිනේෂ් කුමාර සේනානායක
ගිණුම් අංකය : 0803-180400-201

දිනේෂ් කුමාර සේනානායක ගෙන් ඇමෙරිකානු ඩොලර් පනස් පන් දහස් අටසිය විසි එකයි ශත හතළිස් හතරක (USD 55,821.44) මුදලක් ශ්‍රී ලංකා ජනරජයේ බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, 2024 පෙබරවාරි 13 වැනි දින දක්වා නොගෙවන ලද බැංකුමය කටයුතු පහසුකම් හි ප්‍රධාන මුළු ගණන සහ එකතු වූ පොළිය සමග පැහැර හැරීම නිසා සහ යම් යම් තත්ත්වයන් හි දී බැංකුව නමට දෙනු ලබන, එකී ශ්‍රී ලංකා ජන රජයේ ප්‍රසිද්ධ නොතාරිස් සිවානන්දම් ඇන්ඩ් ඇසෝසියේට්ස් හි බී. එස්. පී. ගෝමස් විසින් 2016 මාර්තු 8 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 1710 යටතේ ගෙවීමේ දිනය වන තුරු එකී පහසුකම් මත තවදුරටත් පොළිය එකතු වනු ඇති හෙයින්,

එය සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය සහ එහි සංශෝධන ("එකී 1990 අංක 4 දරන පනත") යටතේ මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට පහත සඳහන් කරන ලද මුදල් ආපසු ලබා ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති එකී ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රසිද්ධ නොතාරිස් සිවානන්දම් ඇන්ඩ් ඇසෝසියේට්ස් හි බී. එස්. පී. ගෝමස් විසින් 2016 මාර්තු 8 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 1710 මගින් පබ්ලික් බැංකුව බර්හාඩ් හට උකස් කරන ලද දේපළ එකී ජනරජයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතාට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලය පවරා ඇති බව

1. නොගෙවන ලද බැංකුමය පහසුකම් මත දිය යුතු සමස්ථ ප්‍රධාන මුළු ගණන වන ඇමෙරිකානු ඩොලර් හතළිස් නව දහස් නවසිය අසූ දෙකයි ශත පනස් පහ (USD 49,982.55ක) මුදලක් සහ ඒ මත දිය යුතු එකතු වූ පොළිය වන ඇමෙරිකානු ඩොලර් පන්දහස් අටසිය තිස් අටයි ශත අසූ නවයක (USD 5,838.89) මුදලක් සමග 2024 පෙබරවාරි 13 වැනි දින දක්වා එකතුවන ඇමෙරිකානු ඩොලර් පනස් පන් දහස් අටසිය විසි එකයි ශත හතළිස් හතරක (USD 55,821.44) මුදලක් පැහැර හැරීමෙන්,
2. 2024 පෙබරවාරි 14 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා (දවස් දෙක ඇතුළත්) ඇමෙරිකානු ඩොලර් හතළිස් නව දහස් නවසිය අසූ දෙකයි ශත පනස් පහ (USD 49,982.55) එකී සමස්ථ ප්‍රධාන මුළු ගණන මත දිය යුතු තවදුරටත් එකතු විය හැකි සහ බවට පත්විය හැකි පොළිය.
3. එකී 1990 අංක 4 දරන පනතේ 13 වගන්තිය යටතේ අය කර ගත හැකි සියලුම මුදල්, වියදම් සහ අයකිරීම්.

එය තවදුරටත් සම්මත කරගන්නා ලදී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද එකී ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තිය යටතේ අවශ්‍ය පරිදි පෙර සඳහන් වන සම්මුතියේ නිවේදනයක් පළ කරන්නට බැංකුවේ ශ්‍රී ලංකා ශාඛා මෙහෙයුම් ආයතන ප්‍රධානී හට බලය පවරා ඇති බව සහ එකී උකස් දේපළ විකිණීමේ දී එකී 1990 අංක 4 දරන පනත මගින් නිර්දේශ කළ ක්‍රමය/ ක්‍රියා පිළිවෙල අනුගමනය කරන්නට යැයි

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නාගරික සභා සීමා ඇතුළත කොට්ඨාස අංක 19, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 498, මලපල්ල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත, මලපල්ල ගමේ පිහිටි ඇතුරුගිරිය පාරේ, අංක 342/2 දරන ස්ථානයේ "කීනගහවත්ත *හෙවත්* සම්බුද්දි වලුකීනගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් 2014 දෙසැම්බර් 3 වැනි දින පිළියෙල කරන ලද අංක 4793 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01B වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් 1A සහ 1C මගින් ද, නැගෙනහිරට : අංක 2029 දරන පිඹුරේ මෙහි ලොට් 1C සහ 2 මගින් ද, දකුණට : මෙහි ලොට් 1 මගින් ද සහ බස්නාහිරට: අංක 2029 දරන පිඹුරේ ලොට් 2, අංක 1724 දරන පිඹුරේ ලොට් 5 සහ 2 මගින් ද මායිම් වූ එකී අංක 4793 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයයි දශම නවයයි බිංදුවක (පර්. 10.90)ක *හෙවත්* හෙක්ටෙයාර් 0.0276ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරුව C 131/103 යටතේ ලියාපදිංචි කර ඇත.

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නාගරික සභා සීමා ඇතුළත කොට්ඨාස අංක 19, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 498, මලපල්ල බටහිර ග්‍රාම නිලධාරි

කොට්ඨාසය ඇතුළත, මලපල්ල ගමේ පිහිටි "කීනගහවත්ත *හෙවත්* සම්බුද්දි වලුකීනගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් 2014 දෙසැම්බර් 3 වැනි දින පිළියෙල කරන ලද අංක 4793 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01C වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට ඃ අතුරුගිරිය පාර - 3 වන පටුමග මගින් ද, නැගෙනහිරට ඃ අතුරුගිරිය පාර - 3 වන පටුමග මගින් ද, දකුණට ඃ මෙහි ලොට් 1B සහ 1A මගින් ද සහ බස්නාහිරට ඃ මෙහි ලොට් 1B සහ 1A මගින් ද මායිම් වූ එකී අංක 4793 දරන පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි දශම පහයි බිංදුව (පර්. 0.50ක) *හෙවත්* හෙක්ටෙයාර් 0.0013 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරුව C 131/104 යටතේ ලියාපදිංචි කර ඇත.

සහතික කරන ලද සත්‍ය පිටපත,

සමාගම් ලේකම්.

2024 ක් වූ පෙබරවාරි මස 27 වැනි දින.

03-398

පීවී 00204407.

## සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"රිසිල්කෝ ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "රිසිල්කෝ ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙ හි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2018.09.18" වැනි දින සංස්ථාපිත සමාගමක්වන "රිසිල්කෝ ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "රිසිල්කෝ ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපාහරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් සංජීව දිසානායක වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සංජීව දිසානායක,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03 - 405

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.